## (47) සිංහල සාහිත්‍ය රසාස්වාදය

### ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

මෙම ප්‍රශ්න පත්‍රය I පත්‍රය හා II පත්‍රය යන කොටස් දෙකකින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ල ම නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය ග්‍රන්ථ ඇසුරෙන් සකස් වේ.

**මුළු ලකුණු 100යි** **කාලය පැය 03කි.**
**(අමතර කියවීම් කාලය මිනිත්තු 10යි.)**

I **පත්‍රය** **කාලය පැය 01කි.**

* මෙම පත්‍රය අනිවාර්ය ප්‍රශ්න **දෙකකින්**(02) සමන්විත වේ. එම ප්‍රශ්න දෙක සඳහා **ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සැපයිය යුතු ය.

**පළමුවන ප්‍රශ්නය** - අනුකොටස් 2 බැගින් යුත් කෙටි පිළිතුරු සැපයීම් වර්ගයේ ප්‍රශ්න **පහකින්** සමන්විත වේ.
එක් කොටසකට ලකුණු 04 බැගින් (5 x 04 = 20) ලකුණු 20කි.

**දෙවන ප්‍රශ්නය** - අවබෝධය හා සාහිත්‍ය දැනුමට අදාළ ව්‍යුහාත්මක ප්‍රශ්නයක් වන මෙය ගද්‍ය/පද්‍ය ලෙස විකල්ප ප්‍රශ්න 2කින් සමන්විත වේ. ඉන් **එකකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය. ලකුණු **20කි.**

I පත්‍රය සඳහා මුළු ලකුණු **40**කි.

II **පත්‍රය** **කාලය පැය 02කි.**

* උත්තර සැපයීම සඳහා දී ඇති පොත භාවිත කරන්න.
මෙම පත්‍රය ප්‍රශ්න **පහකින්** සමන්විත වේ. **පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම **අනිවාර්ය** වේ. ප්‍රශ්න අංක 2, 3, 4, 5 අතුරෙන් තෝරාගත් ප්‍රශ්න **දෙකක්** ඇතුළු ව ප්‍රශ්න **තුනකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

පළමු ප්‍රශ්නය නිර්දිෂ්ට පද්‍ය පන්තියක් පිළිබඳ රසාස්වාදයක් සැපයිය යුතු ප්‍රශ්නයකි. මෙය රචනාමය ස්වරූපයෙන් හෝ ව්‍යුහගතමය ආකාරයෙන් හෝ ඉදිරිපත් කළ හැකි ය. අවම වචන සංඛ්‍යාව 200කි. ලකුණු **30කි.**

තෝරාගත් එක් ප්‍රශ්නයකට ලකුණු **15** බැගින් ප්‍රශ්න දෙක සඳහා ලකුණු 30කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු **60**කි.

| | | | | |
|---|---|---|---|---|
| අවසාන ලකුණු ගණනය කිරීම | I පත්‍රය සඳහා : | 1 ප්‍රශ්නය | ලකුණු 20 | 40 |
| | | 2 ප්‍රශ්නය | ලකුණු 20 | |
| | II පත්‍රය සඳහා : | I ප්‍රශ්නය | ලකුණු 30 | 60 |
| | | තෝරාගත් ප්‍රශ්න 2 (02 × 15) | ලකුණු 30 | |
| | | මුළු ලකුණු | | 100 |

* I **පත්‍රය** හා II **පත්‍රය** සඳහා පිළිතුරු සපයා සම්පූර්ණ කාලය අවසානයේ දී **වෙන වෙන** ම භාර දිය යුතු ය.

## I පත්‍රය

I පත්‍රයේ ඇති ප්‍රශ්න දෙක සඳහා **ප්‍රශ්න පත්‍රයේ** ම උත්තර සපයා **වෙන** ම භාර දෙන්න.

1. (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා ඒවා ඇසුරෙන් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට **කෙටි උත්තර** ලියන්න.
(ලකුණු 04 × 5 = 20යි.)

(i) "දේවයන් වහන්ස බිසවුන් වහන්සේ තනි ව වැඩ සිටි සෙයින් වැද්ද නොහෙමි"

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

........................................................................................................................

(ආ) මෙහි **බිසවුන් වහන්සේ** යනුවෙන් හැඳින්වූයේ කවුරුන් ද?

........................................................................................................................

(ii) "ගියත් සුළුගෙයි වහා එව"

(අ) මෙහි **සුළුගෙයි** යනුවෙන් ඇමතුණු අයගේ නම ලියන්න.

........................................................................................................................

(ආ) මෙම පාඨය ඇතුළත් මුල් කෘතිය නම් කරන්න.

........................................................................................................................

(iii) "ඩිංගිගෙන් බත් ඉල්ලා ගෙන කාල නිදා ගන්න"

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

........................................................................................................................

(ආ) මෙය ශ්‍රවණය කළ තැනැත්තා අනතුරු ව කළේ කුමක් ද?

........................................................................................................................

(iv)
රුදුරු ගිනි කඳක් ගත් සඳෙහි වන'තුරු
මිතුරු වේය දිගතින් හමන මඳ මරු
**මිතුරු** නැසීමට එම වෙයි පසමිතුරු
**මිතුරු** නැකෙනෙක් නිවතුන් හට කවුරු

(අ) මෙහි මුල් කවි පද දෙකේ අදහස ලියන්න.

........................................................................................................................

(ආ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.

........................................................................................................................
........................................................................................................................
........................................................................................................................

(v)
පිරුණු ලොරිය ගම් දොරකඩ පියමං කර යනවා
පාර වුණත් හිරිහැරයක් නෑ ඔහෙ නිදියනවා
පැලේ වහල ඇද හැලිලා මාසයක් ම වෙනවා
පරාල තුනකට අයියා හිරේ හුහුං ලනවා

(අ) **පාර වුණත් හිරිහැරයක් නෑ ඔහෙ නිදියනවා** යන්නෙන් මතු කෙරෙන අර්ථය කුමක් ද?

........................................................................................................................
........................................................................................................................

(ආ) මෙම කවිය ඇතුළත් පැදි පෙළේ රචකයා කවරෙක් ද?

........................................................................................................................

2. පහත දැක්වෙන ගද්‍ය-පද්‍ය කොටස් දෙකින් **එක කොටසකට පමණක්** උත්තර සපයන්න.

ඉක්බිති රජ්ජුරුවෝ බිසවුන් ගිවිස්වමින් “දේවීනි, ප්‍රභාවතීන් කපා නො දී අනික් කුමක් කරවු ද, තොපගේ දියණියෝ සියලු දඹදිවට අග්‍ර රජ්ජුරුවන් විරූපයයි හැරපියා ගිය මග එම පිය නොමැකෙන තෙක් මරණ නළල තිබා ගෙන අවුය. දැන් තමාගේ රූ නිසා කරන ලද ඊර්ෂ්‍යාවෙහි විපාක ලබන්නී වේ දැ” යි කීහ.

එබස් අසා බිසෝ දියණියන් ළඟට ගොස් අඬමින් වලපමින් “දියණියෙනි, තොපට අමනාපයක් සිතිනුත් නොසිතන්නා වූ මාගේ බස් නොගිවිස තොප දැන් ලේ පෙර පෙරා සත්කඩක් කොට කපා මේ රජදරුවන්ට දෙන ලදුව යමපුරයට යන්නී වේ ද. තව ද මේ ලෝකයෙහි යම් සත්වයෙක් වැඩෙහි හැසිරෙන හිතේෂින්ගේ කීම නොකරන්නේ ද එතෙම මෙබඳු වූ දුක්කම්කටුළු ලදුව නොයෙක් අනය ව්‍යසනයට ද පැමිණෙන්නේ ය. තව ද රන් කමින් උදුල මාණික්‍ය මේඛලාදාමයෙන් විරාජමාන වූ ප්‍රභාවතීනි, ඉදින් තමාගේ සිත් පස්සේ නොගොස්, උභය කුල පරිශුද්ධ අසම්භින්න සූර්යවංශප්‍රසූත ශෞරවීර්යවික්‍රම සමන්විත කුසරජ්ජුරුවන් හා එක් ව තොප හා සමාන රූපශ්‍රීන් ඇති දැකුම් කටයුතු වූ කුමාර කෙනෙකුන් ලද හොත් අප ඇම ඇතුළු වූ බොහෝ ඥාතිවර්ගයා විසින් සත්කාර සම්භාවනා කරන ලදුව සියලු දුක් දුරුකොට බොහෝ දවසක් සැප සේ වාසය කරන්නී වේ ද”

(i) මෙම උද්ධෘතය ඇසුරෙන් ඉස්මතුවන පබාවතියගේ චරිත ලක්ෂණ **දෙකක්** ලියන්න. **(ලකුණු 04 යි)**

..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................

(ii) කුස ජාතක කතුවරයා අපූර්වත්වයෙන් භාෂාව හසුරුවා ඇති ආකාරය ඇඟවෙන නිදසුන් **දෙකක්** ඉදිරිපත් කරන්න. **(ලකුණු 04 යි)**

..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................

(iii) රාජ්‍ය පාලනයේ දී රජතුමා කටයුතු කළ ආකාරය මෙම පාඨය ඇසුරෙන් කෙටියෙන් විස්තර කරන්න. **(ලකුණු 06 යි)**

..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................

(iv) මෙහි දැක්වෙන පරිදි තම දියණිය මුහුණ දෙන අවාසනාවන්ත සිදුවීම් හමුවේ සංවේගයට පත්වන මවකගේ ස්වරූපය හෙළි කෙරෙන නිදසුන් **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 06 යි)**

..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................

**නැතහොත්**

පෙරදිග ගොරහැඬි රකුසෝ,
මගෙ ධ්‍යානය ඇයි කඩන්නේ
නිදා ගන්න පොරොව ගත්ත
කළු රෙදි පොට
මොකට ද මේ
තීරුවලට ඉරා දමන්නෙ

කුරුල්ලන්ට ගල් ගහලා
උන් හොඳට ම බිය කරලා
මල් පොහොට්ටු තිගැස්සිලා
කඳුළු හෙලනවා

ඇස් දෙක මම අරින්නේ නෑ
තුරුලු කරන් භාවනාව
නැවතත් යන්නට යනවා
මම
මගේ ඇහැන ලෝකයට ම

(i) හිරු උදාව කවියාගේ උදහසට ලක් වී ඇත්තේ කුමක් හෙයින් ද? **(ලකුණු 04 යි)**

.....................................................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................

(ii) කවියා යොදාගෙන ඇති කාව්‍යෝක්ති **දෙකක්** ලියන්න. **(ලකුණු 04 යි)**

.....................................................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................

(iii) ස්වාභාවික සිදුවීමක් අපූර්වත්වයෙන් ඉදිරිපත් කර ඇති ආකාරය කෙටියෙන් විස්තර කරන්න. **(ලකුණු 06 යි)**

.....................................................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................

(iv) සරල සුගම බස් වහරක් යොදා ගැනීම කවි පෙළේ සාර්ථකත්වයට හේතු වී ඇති අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 06 යි)**

.....................................................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................

* *

## II පත්‍රය

**සැලකිය යුතුයි :**

* **පළමු** වැනි ප්‍රශ්නය ද, 2, 3, 4, 5 ප්‍රශ්නවලින් තෝරා ගත් ප්‍රශ්න **දෙකක් ද ඇතුළු ව ප්‍රශ්න තුනකට** පිළිතුරු සපයන්න. මේ සඳහා ලබාදෙන පොතෙහි II පත්‍රයට අදාළ පිළිතුරු සපයා වෙන ම භාර දෙන්න.

1. පහත දී ඇති පැදි පෙළ කියවා දී ඇති ප්‍රකාශ උපයෝගි කොට ගෙන රසාස්වාදයක් ලියන්න. පිළිතුරක වචන 200ක්වත් තිබිය යුතු ය.

විචිරි චිරි විචිරි චිරි උදේ සිට ඇද හැලෙන
පොද නො කැඩි තෙත බරිව හිරිකිතෙන් කිලිපොළන
පාර තොට, ගහ කොළ ද, වසා ගෙන හැම අතින
වහින වැහි වහින වැහි නො පායන මුළු දවස

ගොහොරු මඩ ඇඟිලි කරු අතර චිරි චිරි ගාන
මඩ කඩිති හැම තැන ම මඩ පාට දිය රැඳුණ
අලුත් පස් දැමූ පාර දණිහ තෙක් මඩ එරෙන
බැනියම ද ඇඟට ඇලි උදේ සිට තෙත බරිව

තෙමුණ රෙදි ඇඟ ඇලුණ හබුරු කොළ මලිපිටි ද
දෝර ගොස් හැම තැන ම වක්කලන් ඇලි හැදුණ
හැට්ට අත් කඳ කලව තෙත රෙද්ද ඇඟ එතුව
වහින වැහි තද හුළඟ නො පායන මුළු දවස

ඔළුව කෙස් තෙත බරිව පිට දිගේ වැක්කෙරෙන
කාර් රෝදෙන් විරිස් ඇඟ පුරා මඩ ඉහෙන
ආයිමත් හිටි ගමන් තද කරන් එන සැණින
වහින වැහි වහින වැහි නො පායන මුළු දවස

ගෙදර ගොස් ඇඳපු දේ මොහොතකින් ඉවර කොට
තුවායෙන් ඇඟ පත ද පිහ දමා හිස කෙස් ද
අලුත් සරමක් ඇඳන් උණට උණු තේ වතුර
ඇඳෙහි ඉඳ උණුහුමට බොන්නෙ කොයි මොහොතෙ දැ යි
වැහි පොදෙහි පෙඟුණ සිත හිත හිතා ලත වේ ය

(අ) මෙම පැදිපෙළට පාදක වූ අත්දැකීම

(ආ) කවියාගේ අත්දැකීමට අදාළ විවිධ දර්ශන ඉදිරිපත් කර ඇති අනුපිළිවෙළ

(ඉ) මධ්‍යම පාන්තික සමාජය කෙරෙහි කවියා දක්වන ආකල්ප

(ඊ) කවියා සිය අත්දැකීම් සාර්ථක ව ඉදිරිපත් කිරීම සඳහා යොදා ගත් ආකෘතිය

(උ) මෙහි යොදා ගෙන ඇති ශබ්දධ්වනි

**(06 x 5 = 30යි)**

2. පොදු ජනතාවට යෝග්‍ය ආකාරයෙන් උපදේශ ඉදිරිපත් කිරීමේ දී සුභාෂිතය කවියා භාවිත කළ කාව්‍යෝපක්‍රම කවරේ දැ යි නිදසුන් **තුනක්වත්** දක්වමින් විමසන්න. **(ලකුණු 15 යි)**

3. "විරූපී භාවය නිසා පසුතැවිල්ලට පත් වූ පුද්ගලයෙකුගේ ලක්‍ෂණ කුස චරිතයෙන් නිරූපණය කෙරෙයි." කුස ජාතක කථාවෙන් නිදසුන් **තුනක්වත්** දක්වමින් සාකච්ඡා කරන්න. **(ලකුණු 15 යි)**

4. පොදු ජනතාවගේ මනෝභාවයන් අව්‍යාජත්වයෙන් යුතු ව නිරූපණය කිරීමෙහි ලා ජන කවියා දක්වන දක්ෂතාව අභිමත නිදසුන් **තුනක්වත්** ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 15 යි)**

5. ගැමියන්ගේ චර්යා හා සිතුම් පැතුම් සිත් ගන්නා අයුරින් ඉදිරිපත් කිරීම සඳහා තුංමංහන්දිය කතුවරයා දැරූ ප්‍රයත්නය කොතෙක් දුරට සාර්ථක වී දැ යි අභිමත චරිතයක් ආශ්‍රයෙන් නිදසුන් **තුනක්වත්** දක්වමින් සාකච්ඡා කරන්න. **(ලකුණු 15 යි)**

* * *